ISSUE NO 05

දෙසැම්බර් 2023

# Cyber Guardian

Publication for your online safety

SRI LANKA CERT|CC
Sri Lanka Computer Emergency Rediness Team
Coordination Centre

### 2023 සයිබර් ආරක්ෂාව සම්බන්ධ පසුවිපරමක්

## 3000කට සයිබර් ආරක්ෂණ පුහුණුවක්



2023 වසරේ සයිබර් ආරක්ෂාව පිළිබඳව 3000කට වැඩි පිරිසකට පුහුණුව ලබා දීමට ශ්‍රී ලංකා සර්ට් ආයතනය කටයුතු කර තිබේ. රාජ්‍ය අංශයේ විවිධ මට්ටමේ තොරතුරු තාක්ෂණ නිලධාරින්, තාක්ෂණ විෂයභාර ගුරුවරුන්, මාධ්‍යවේදීන්, පුද්ගලික අංශයේ තොරතුරු තාක්ෂණ නිලධාරීන් මෙම පිරිසට අයත් වේ. මීට අමතරව විශ්වවිද්‍යාල පාසල් සහ අධ්‍යාපන පීඨ වල සිසු සිසුවියන් විශාල ප්‍රමාණයකට සයිබර් ආරක්ෂාව පිළබඳ දැනුම ලබා දී ඇත. මෙම පුහුණු වැඩමුළු ජාතික සයිබර් ආරක්ෂණ ප්‍රතිපත්තියට අනුව ක්‍රියාත්මක කර ඇත.

විශේෂයෙන්ම රාජ්‍ය ආයතනවල තොරතුරු ආරක්ෂණ නිලධාරින් ලෙස නම් කරන ලද නිලධාරින් සදහා සයිබර් ආරක්ෂණ මූලධර්ම, අවදානම් කළමනාකරණය, සයිබර් ආරක්ෂණ තාක්ෂණික ක්‍රමවේද, සයිබර් ආරක්ෂණය, දත්ත ආරක්ෂණය සම්බන්ධව පවතින නීති, පරිගණක යෙදෙවුම් හා ජාල සම්බන්ධයෙන් වන ආරක්ෂාව යනා දී වශයෙන් වැඩමුළු 34 ක් සිදුකර ඇති අතර එමගින් ඔවුන්ගේ දැනුවත්භාවය වැඩිකිරීමට අවශ්‍ය කටයුතු සිදුකෙරේ. තවද ශ්‍රී ලංකා සර්ට් ආයතනය තාක්ෂණ අමාත්‍යංශය හා එක්ව තොරතුරු හා සයිබර් ආරකෂණය රාජ්‍ය ආයතනතුළ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වන චක්‍ර ලේඛනය ද නිකුත් කර තිබේ.

## සයිබර් ආරක්ෂණය වැඩිදියුණු කිරීමට රාජ්‍ය සහ පෞද්ගලික ආයතන සඳහා ලබා දෙන සේවාවන්

ශ්‍රී ලංකා සර්ට් ආයතනය පසුගිය වසර තුළ රාජ්‍ය සහ පෞද්ගලික ආයතනවල සයිබර් ආරක්ෂණය වැඩි දියුණු කිරීම සදහා විශාල දායකත්වයක් දක්වන ලදී. මේ අනුව (Risk, Governance and Compliance) අවදානම් ඇගයීම් 11 ක්ද වෙබ් අඩවි සහ යෙදෙවුම් ආරක්ෂණ විගණනයන් 118 ද ජංගම දුරකථන සම්බන්දයෙන් පරීක්ෂණ 09 ද ජාල සම්බන්ධයෙන්වන ඇගයීම් 14 ක්ද වෝහාරික පරීක්ෂණ සදහා සහය දීම 23 ද සිදුකර ඇත. මෙම ක්‍රියාවන් මගින් රාජ්‍ය ආයතන වල මෙන්ම පෞද්ගලික ආයතනවල සයිබර් ආරක්ෂාව වැඩිදියුණු කිරීමට සර්ට් ආයතනය සහාය ලබා දී තිබේ.



# ප්‍රධාන ව්‍යාපෘති

2023 වසරේදී ශ්‍රී ලංකා සර්ට් ආයතනයට ජාතික මට්ටමින් වැඩි වැදගත්කමක් ඇති ව්‍යාපෘති ගණනාවක් ආරම්භ කිරීමට හැකිවිය.

**1) ජාතික සයිබර් ආරක්ෂණ මෙහෙයුම් මධ්‍යස්ථානය (NCSOC)**

මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙන් පසු තීරනාත්මක ඩිජිටල් යටිතල පහසුකම් සම්බන්ද ආයතන වෙත එල්ලවන ආරක්ෂණ සිදුවීම් නිරතුරුවම හදුනා ගැනීම අපේක්ෂා කෙරේ. මෙම ව්‍යාපෘතිය සදහා වන දෘඩාංග ලබා ගැනීමට මූලික ප්‍රතිපාදන 2023 වසරේ අග භාගයේදී ලැබුණ අතර එහි කටයුතු සම්පූර්ණ කිරීමට 2024 සහ 2025 වර්ෂ වලදී හැකිවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**2) ජාතික සහතික පත්‍ර අධිකාරිය (NCA)**

මෙම ව්‍යාපෘතිය මගින් ඩිජිටල් සහතික පත්‍ර නිකුත්කරන ආයතන සදහා වන සහතික පත් නිකුත්කිරීම සිදුකෙරේ. ඒ සදහා දැනට සහතිකයක් නිකුත් කිරීමේ ආයතන ලෙස Lankapay ආයතනය ක්‍රියාත්මක වීමට නියමිතයි.

**3) ජාතික නිපුනතා සුදුසුකම් (NVQ)**

ශ්‍රී ලංකා සර්ට් ආයතනය ජාතික වෘත්තිය පුහුණු කොමිසම සමග එක්ව සයිබර් ආරක්ෂණ තාක්ෂනය සම්බන්දයෙන් වන ජාතික ඩිප්ලෝමාව සදහා අවශ්‍ය වන ජාතික නිපුනතා සුදුසුකම්. NVQ නිර්මාණයකර ඇති අතර එය ගම්පහ කාර්මික තාක්ෂණ ආයතනයේදී ආරම්භ කිරීමට කටයුතු කරන ලදී. දැනට සිසුන් 24ක් මෙම ඩිප්ලෝමාව සදහා ලියා පදිංචි වී ඇත. 2024 වසර සදහා අයදුම්පත් 50 කට අධික සංඛ්‍යාවක් ලැබී ඇත.












සන්නිවේදනය







# සයිබර් තර්ජන සහ සමාජ මාධ්‍ය සම්බන්ධ සිදුවීම් 20,000+




2023 වසරේ ශ්‍රී ලංකා සර්ට් ආයතනය වෙත සමාජ ජාලා ආරක්ෂාව සම්බන්ධයෙන් වන සිදුවීම් 20033 ද සයිබර් ආරක්ෂාව සම්බන්දයෙන් වන සිදුවීම් 409 ක්ද වාර්තා වී ඇත. ශ්‍රී ලංකා සර්ට් ආයතනය දේශීය හා අන්තර් ජාතික ආයතනවල සහයෙන් එම ගැටලුවලට පිළියම් ලබා දී තිබේ. අන්තර්ජාලය හා සමාජ මාධ්‍ය හරහා සිදු කෙරෙන තර්ජන, බිය වැද්දීම් මෙන්ම ව්‍යාජ ගිණුම් හරහා කෙරෙන බලපෑම් ඒ අතර වෙයි. සයිබර් ආරක්ෂාව පිළිබද පැමිණිලි අතර වැඩි ප්‍රමාණයක් වාර්තා වී ඇත්තේ මාර්ගගතව සිදුකෙරෙන හිරිහැර කිරීම්, ලුහුබැඳීම සහ පුද්ගලයන් හෝ කණ්ඩායම් ඉලක්ක කරන හිරිහැරයි.

අපරාධකරුවන් අන් අය බිය ගැන්වීම්, තර්ජනය කිරීම් හෝ හානි කිරීමට සමාජ මාධ්‍ය, වේදිකා හෝ වෙනත් සබැඳි සංසද භාවිතා කිරීම සිදු කරයි. ඊට අමතරව සිදුකෙරෙන වෛරී අපරාධවලට ජාතිය, ආගම, වාර්ගිකත්වය, ස්ත්‍රී පුරුෂ භාවය, ලිංගිකත්වය යනා දී ලක්ෂණ මත පදනම්ව පුද්ගලයන්ට හෝ කණ්ඩායම්වලට එරෙහිව කරන වැරදි ඇතුළත් වේ.

පුද්ගලික තොරතුරු වලට අනවසරයෙන් ප්‍රවේශ වීම, දත්ත කඩ කිරීම් සහ අනන්‍යතා සොරකම් කිරීම, තතුබෑම් ප්‍රහාර, අනිෂ්ට මෘදුකාංග සහ සංවේදී තොරතුරු මුල්කරගනිමින් කෙරෙන තර්ජන හා කප්පම් ඉල්ලීම්ද ඇතුලත් වේ.

අන්තර්ජාල හා සමාජ මාධ්‍ය භාවිතයේදී ප්‍රවේසම්කාරී හා ආරක්ෂාකාරී ක්‍රම භාවිතා නොකිරීම, නොසැලකිලිමත් බව, නොදැනුවත් භාවය වැනි හේතු මෙම අපරාධවලට ගොදුරු වීමට බෙහෙවින් බලපෑ ඇති බව ශ්‍රී ලංකා සර්ට් ආයතනය පවසයි. එම නිසා සයිබර් ආරක්ෂාව පිළිබද දැනුවත් භාවය ඇතිව මෙම මාධ්‍ය භාවිතා කිරීමේ අවශ්‍යතාව ශ්‍රී ලංකා සර්ට් ආයතනය අවධාරණය කර සිටියි.

සයිබර් ආරක්ෂාව පිළිබද ජනතාව දැනුවත් කිරීම ඉතා අවශ්‍ය කරුණකි. ඒ සදහා සාම්ප්‍රදායික මාධ්‍ය මෙන්ම සමාජ මාධ්‍ය ජාලාවන් භාවිතා කිරමේ සන්නිවේදන ක්‍රියාවලිය විධිමත්ව ආරම්භ කිරීමට අගෝස්තු මාසයේ දී හැකිවිය. ඒ අනුව රූපවාහිනී වැඩසටහන් 10ක් ද ගුවන් විදුලි වැඩසටහන් 07ක් මෙන්ම මුද්‍රිත මාධ්‍ය ලිපි පුවත් 09 ක් ජනතාව දැනුවත් කිරීමට යොදා ගැනීමට හැකිවිය. මාසිකව සිංහල දෙමළ හා ඉංග්‍රීසි භාෂා තුනින්ම පුවත් ප්‍රකාශ (News-letter) 06 ක් ප්‍රකාශයට පත්කෙරින. මේ සෑම ප්‍රකාශයක්ම සයිබර් ආරක්ෂාව පිළිබද සාමාන්‍ය ජනතාව අතරට ගෙනයාම සදහා සමාජ මාධ්‍ය වේදිකා භාවිතා කළ අතර විශේෂිත සමාජ මාධ්‍ය post 60 කට වැඩි ප්‍රමාණයක් නිර්මාණය කර සමාජ ගත කිරීමටද හැකිවිය. සයිබර් ආරක්ෂාව පිළබඳ ජනතාව දැනුවත් කිරීමේදී සෑම ජන මාධ්‍යක්ම වඩාත් පලදායි සහයක් ලබා දෙනලදී.

SRI LANKA CERT MEDIA